ජනතා වතු සංවර්ධන මණ්ඩලය
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
ඇබෑර්තු

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සදහන් තනතුරු සදහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැදවනු ලැබේ. තෝරාගන්නා ලද අයදුම්කරුවන් රජය විසින් නිකුත් කරන ලද හා ඉදිරියේදී නිකුත් කිරීමට අපේක්ෂිත අණ පණත් හා ආයතනික නීති රීති, රෙගුලාසි හා ප්‍රතිපත්තිවලට අනුකූලව තනතුරට අදාල කාර්යයන් ඉටුකිරීමට මනා හැකියාවක් ඇති අය විය යුතුය.

<u>කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන</u>

රජය විසින් ලබා දී ඇති උපදෙස් හා ආයතනික ප්‍රතිපත්තිවලට අනුකූලව සියළු ආයතනික කටයුතු ,නෛතික හා විනය කටයුතු සහ මානව සම්පත් සංවර්ධන කටයුතු සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.

සුදුසුකම් හා පලපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය හෝ කළමනාකරණය පිළිබද උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)

1. **ඉහත** සදහන් බාහිර අයදුම්කරුවන් සදහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. “ කණිෂ්ඨ කළමනාකාර “ JM සේවාගණයෙහි අදාළ කේෂ්ත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සේවා ගණය : “ කළමනාකාර”

වැටුප් තලය : MM 1-1 රු. (91,690/-10x2,480/-15x3,450/-168,240/-)

වයසස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා
උපරිම වයස් සීමාව බල නොපායි.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

<u>පොදු</u>

පත්වීමේ ස්වභාවය ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා
හිමිකම් සහිතයි.

සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සදහා මෙන්ම දිවයිනේ ඕනෑම
ප්‍රදේශයක සේවය කිරීම සදහා අවශ්‍ය වන කායික හා මානසික යෝගයතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
iv. අනුමත බඳවාගැනීමේ පටිපාටිය අනුව සියළුම සුදුසුකම් සපුරාලිය යුතුය.

සුදුසුකම් ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු නිළධාරීන් තෝරාගනු ඇත. අයදුම්කරු පිළිබද තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්ද සහිතව සකස්කරන ලද අයදුම්පත් 2026.10.19 වන දින හෝ ඊට ප්‍රථම සභාපති,ජනතා වතු සංවර්ධන මණ්ඩලය,55/75 වොක්ෂෝල් පටුමග, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සදහන් කල යුතුය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

සභාපති
ජනතා වතු සංවර්ධන මණ්ඩලය

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED